# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2494/12 - 2026 ජුනි මස 23 වැනි අඟහරුවාදා - 2026.06.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධිත, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 සහ 18 වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලද පද්ධති බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, හිමිකම් පැවරීම, සංශෝධනය කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ පටිපාටි.

එයාර් වයිස් මාර්ෂල් **බන්දුල හේරත්** (විශ්‍රාමික),
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

2026 ජුනි මස 12 වැනි දින,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
267, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 සහ18 වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලද, 2023 ඔක්තෝබර් 25 දිනැති අංක 2355/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, පද්ධති බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, හිමිකම් පැවරීම, සංශෝධනය කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ පටිපාටි පහත දක්වා ඇති පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**1. උපලේඛනය 1, අ කොටස, පහසුකම් පාදක කරගත් ක්‍රියාකරු (FBO) බලපත්‍ර නිකුත් කිරීම යටතේ අයිතම අංක 2.1.22 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*"සියලුම අදාළ විස්තර සහිතව, නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-1-A අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී, අයදුම්කරු විසින් රු. 300,000 ක අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සහ අදාළ බදු ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. බලපත්‍ර ක්‍රියාවලියේදී අයැදුම්කරුවෙකුගේ බලපත්‍ර ලබාගැනීමේ සාර්ථකභාවය, අසාර්ථකභාවය මත මෙම අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම අදාළ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තු ගෙවා නොමැති නම්, කිසිදු අයදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ".*


1A - PG 7762 — 28 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2. උපලේඛනය 1, ආ කොටස, සේවා පාදක ක්‍රියාකරු (SBO) බලපත්‍ර නිකුත් කිරීම යටතේ අයිතම අංක 2.6.22 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*"සියලුම අදාළ විස්තර සහිතව, නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-1-B අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී, අයදුම්කරු විසින් රු. 300,000 ක අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සහ අදාළ බදු ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. බලපත්‍ර ක්‍රියාවලියේදී අයැදුම්කරුවෙකුගේ බලපත්‍ර ලබාගැනීමේ සාර්ථකභාවය, අසාර්ථකභාවය මත මෙම අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම අදාළ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ගෙවා නොමැති නම්, කිසිදු අයදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ."*

**3. උපලේඛනය 2, අ කොටස, පහසුකම් පාදක ක්‍රියාකරු (FBO) බලපත්‍ර අලුත් කිරීම යටතේ අයිතම අංක 3.1.3 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*" සියලුම අදාළ විස්තර සහිතව, නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-2-A අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී, අයදුම්කරු විසින් රු. 300,000 ක අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සහ අදාළ බදු ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. බලපත්‍ර ක්‍රියාවලියේදී අයැදුම්කරුවෙකුගේ බලපත්‍ර ලබාගැනීමේ සාර්ථකභාවය, අසාර්ථකභාවය මත මෙම අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම අදාළ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ගෙවා නොමැති නම්, කිසිදු අයදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ".*

**4. උපලේඛනය 2, අ කොටස, පහසුකම් පාදක කරගත් ක්‍රියාකරු (FBO) බලපත්‍ර අලුත් කිරීම යටතේ අයිතම අංක 3.1.12 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*"බලපත්‍ර ගාස්තු සඳහා වන ගෙවීම් නිවේදනය නිකුත් කළ පසු, පවත්නා බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට පෙර, ක්‍රියාකරු විසින් අදාළ බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. පවත්නා බලපත්‍රයේ වලංගු කාලසීමාව අවසන් වූ පසු බලපත්‍ර ගාස්තුව ගෙවීමේ දී පනතේ 22 ඔ වගන්තිය ප්‍රකාරව නියම කර ඇති අධිභාරය (surcharge) ගෙවිය යුතුය."*

**5. උපලේඛනය 2, ආ කොටස, සේවා පාදක කරගත් ක්‍රියාකරු (SBO) බලපත්‍ර අලුත් කිරීම යටතේ අයිතම අංක 3.3.3 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*"සියලුම අදාළ විස්තර සහිතව, නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-2-B අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී, අයදුම්කරු විසින් රු. 300,000 ක අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සහ අදාළ බදු ගාස්තු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. බලපත්‍ර ක්‍රියාවලියේදී අයැදුම්කරුවෙකුගේ බලපත්‍ර ලබාගැනීමේ සාර්ථකභාවය, අසාර්ථකභාවය මත මෙම අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම අදාළ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව ගෙවා නොමැති නම්, කිසිදු අයදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ."*

**6. උපලේඛනය 2, ආ කොටස, සේවා පාදක කරගත් ක්‍රියාකරු (SBO) බලපත්‍ර අලුත් කිරීම යටතේ අයිතම අංක 3.3.11 සංශෝධනය කොට ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*"බලපත්‍ර ගාස්තු සඳහා වන ගෙවීම් නිවේදනය නිකුත් කළ පසු, පවත්නා බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට පෙර, ක්‍රියාකරු විසින් අදාළ බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුය. පවත්නා බලපත්‍රයේ වලංගු කාලසීමාව අවසන් වූ පසු බලපත්‍ර ගාස්තුව ගෙවීමේ දී පනතේ 22 ඔ වගන්තිය ප්‍රකාරව නියම කර ඇති අධිභාරය (surcharge) ගෙවිය යුතුය."*

**7. උපලේඛනය 1, අ කොටස, පහසුකම් පාදක කරගත් ක්‍රියාකරු (FBO) බලපත්‍ර නිකුත් කිරීම අයදුම් පත්‍රය 2.3 යටතේ, අයදුපත් පරීක්ෂා කිරීමේ ලැයිස්තුවේ අයිතම අංක 1 සංශෝධනය කොට, ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*" 1. අදාළ බදු ගාස්තු සමග ගෙවිය යුතු අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුවේ රිසිට්පත අමුණා තිබේද? ඔව්/ නැත."*

**8. උපලේඛනය 1, ආ කොටස, සේවා පාදක කරගත් ක්‍රියාකරු (SBO) බලපත්‍ර නිකුත් කිරීම; අයදුම් පත්‍රය 2.8 යටතේ, අයදුම්පත් පරීක්ෂා කිරීමේ ලැයිස්තුවේ අයිතම අංක 1 සංශෝධනය කොට, ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්;**

*" 1. අදාළ බදු ගාස්තු සමග ගෙවිය යුතු අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුවේ රිසිට්පත අමුණා තිබේද? ඔව්/ නැත."*

EOG 06 - 0269

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.